ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,196 — 1957 නොවැම්බර් 15 වැනි සිකුරාදා — 15.11.1957

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම් බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)

	පිට
තානාතුරු-ඇබෑර්තු	—
චීනාඟ, චීනාඟ ප්‍රතිඵල ආදිය ...	—
පළාත් පාලන නිවේදන	909
අතුරු ව්‍යවස්ථා	912
පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම්	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ...	—
අය වැය ලේඛන	—
දේපල විකිණීම්	—
මාඟී කොන්ත්‍රාත් දැන්වීම්	—
විවිධ දැන්වීම්	912

පළාත් පාලන නිවේදන

අංකය: ඇල්.ඩී.බී—16/57/ඇල්ජඩ්—ටී/480.

1946ගේ අංක 3 දරන සුළු නගර සභා ආඥා පනත

2 වැනි, 5 වැනි, 6 වැනි සහ 15 වැනි වගන්ති යටතේ කරන ලද නියෝගය

1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද, 1946ගේ අංක 3 දරන සුළු නගර සභා ආඥාපනතේ 2 වැනි, 5 වැනි, 6 වැනි, සහ 15 වැනි වගන්ති වලින් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව එතුමා විසින් කරන ලද නියෝගයයි.

ජයවීර කුරුප්පු,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1957 ජූලි මස 10 වැනි දින,
කොළඹදීය.

නියෝගය

1. මීටු යාකොට ඇති පළමු වැනි උප ලේඛනයෙහි මායිම්වලින් වෙන් කොට දක්වා ඇති ප්‍රදේශය, (මීට පසුව "ආඥාපනත" යනුවෙන් සඳහන් කෙරෙන) 1946ගේ අංක 3 දරණ සුළු නගර සභා ආඥාපණතේ වූ කාරණා සඳහා සුළු නගරයක් ලෙස සැලකිය යුතුයි. සුළු නගරයේ පාලන සීමා එම උප ලේඛනයේ සඳහන් සීමා ම විය් යුතුයි.

2. ඉහත සඳහන් නගරය සඳහා මෙම ආඥාපනත යටතේ පිහිටුවීමට අදහස් කරනු ලබන්නා වූ සුළු නගර සභාවේ නම සහ විස්තරය පහත දක්වෙන ලේ විය යුතුයි. එනම්:—

"මහරගම සුළු නගර සභාව" යනුවෙනි.

3. මහරගම සුළු නගර සභාව සමන්විත විය යුතු සාමාජික සංඛ්‍යාව හත්දෙනෙකු විය යුතුයි.

4. මහරගම සුළු නගර සභාව පිහිටුවීමට අදහස් කරනු ලබන්නා වූ සුළු නගරය, මීට යාකොට ඇති උප ලේඛනයෙහි විස්තර කරනු ලබන්නා වූ කොට්ඨාස හතකට බෙදා, වෙන් කළ යුතුයි.

5. මහරගම සුළු නගර සභාවේ බුර කාලය 1958 පෙබරවාරි මස 1 වැනිදා ආරම්භ විය යුතුයි.

පළමුවැනි උප ලේඛනය

මහරගම නගර සීමා

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මුදලිගේ කොට්ඨාසයේ සල්පිටිකෝරලේ ව අයත් ගංගොඩවිල, මහරගම, පන්නිපිටිය, ගොඩිගොමුව සහ බොරලැස්ගොමුව යන ගම්මුලාදෑනි කොට්ඨාස තුළ පිහිටි ගංගොඩවිල, නාවින්න, මහරගම, පන්නිපිටිය, ගොඩිගොමුව සහ බොරලැස්ගොමුව යන ගම් වලින් සමන්විතවූ පහත දැක්වෙන මායිම් තුළ පිහිටි මුළු ප්‍රදේශය:—

උතුරට: කොට්මඩු පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ දකුණු සීමාවට, දෙගිවල ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව හමුවන, (එනම්, අවිස්සාවේල්ල පාරේ මැද සිට දකුණු දෙසට දම්වැල් පහක් ඇතින් වූ) ස්ථානයේ සිට කෝට්මඩු පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව දක්වා ද එතැන්සිට ඊශාන දෙසට ද, ගිණිකොණ දෙසට ද, කෝට්මඩු පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ මිරිහාන-කොට්ටාව පාරේ මධ්‍ය රේඛාව දක්වා නැවතත් ඊශාන දෙසට ද, එතැන්සිට, එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ මහරගම බටහිර ගම් සීමාව දක්වා ගිණිකොණ දෙසට ද, එතැන්සිට එකී ගමේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ අංක 66384 දරන වගිවල් ප්ලැනේ වයඹ කොණ දක්වා උතුරු දෙසට හා නැගෙනහිර දෙසට ද, එතැන්සිට, මහරගම ගම් පලැනේ 2776, 2773, 2772 වැනී කැබලිවල උතුරු මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට ද, 2772 වැනි කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ

909—J. N. B 70209—3,212 (11/57)

F 1

දෙසට ද, 2793 වැනි කැබැල්ලේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ද, 2794 වැනි කැබැල්ලේ බටහිර, උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ ඊශාන දෙසට නැගෙනහිර දෙසට හා ගිණිකොණ දෙසට ද, 2795 වැනි කැබැල්ලේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ද, 2770 වැනි කැබැල්ලේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ද, 2770 වැනි කැබැල්ලේ උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට හා දකුණු දෙසට ද, 2797, 2798, 2799, 2800 වැනි කැබැලිවල උතුරු මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට ද, 2800 වැනි කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ සහ පාර හරහා ගිණිකොණ දෙසටද, 2802, 2803, 2805, 2806 වැනි කැබැලිවල නැගෙනහිර මායිම් ඔස්සේ දකුණු දෙසට ද, 2807, 2809 වැනි සහ 2810 වැනි කැබැලිවල නැගෙනහිර මායිම් ඔස්සේ ගිණිකොණ දෙසට ද, 2855 වැනි කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දෙසට හා නැගෙනහිර දෙසට ද, 2854 වැනි කැබැල්ලේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ද, 2853 වැනි කැබැල්ලේ බටහිර මායිම ඔස්සේ නැගෙනහිර දෙසට හා උතුරු දෙසට ද, 2852, 2851 වැනි කැබලිවල බටහිර මායිම් ඔස්සේ ඊශාන දෙසට ද, 2851 වැනි කැබැල්ලේ උතුරු මායිම ඔස්සේ ගිණිකොණ දෙසටද, 2850 වැනි කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ද, 2858 වැනි කැබැල්ලේ උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට හා ගිණිකොණ දෙසට ද, 2871, 2870, 2868, 2866 වැනි කැබැලිවල නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දෙසට ද, 2866 වැනි කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට ද, 2864 වැනි කැබැල්ලේ දකුණු, නැගෙනහිර හා උතුරු මායිම් ඔස්සේ ගිණිකොණ දෙසට ද, ඊශාන දෙසටද, උතුරු දෙසට ද, වයඹ දෙසට ද, 2863, 2862 වැනි කැබැලිවල දකුණු හා බටහිර මායිම් ඔස්සේ වයඹ දෙසට ද, 2860 වැනි කැබැල්ලේ දකුණු, බටහිර හා උතුරු මායිම් ඔස්සේ බටහිර දෙසට, උතුරු දෙසට හා නැගෙනහිර දෙසට ද, 2849, 2844, 2842, 2816, 2817 වැනි කැබැලිවල බටහිර මායිම් ඔස්සේ උතුරු දෙසට ද, 2817 වැනි කැබැල්ලේ උතුරු මායිම ඔස්සේ ඊශාන දෙසට ද, මහරගම ගම් ප්ලැනේ 2840, 2834, 2820 වැනි කැබැලිවල බටහිර මායිම් ඔස්සේ උතුරු දෙසට ද, එතැන්සිට 6416 දරන මුල් ප්ලැනේ ඛඛලිව්. 457 වැනි කැබැල්ලේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට හා 6416 දරන මුල් ප්ලැනේ ඉහත කී කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ ඊශාන දෙසට ද, මහරගම ගම් ප්ලැනේ 2823 වැනි කැබැල්ලේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ වයඹ දෙසට හා ඊසාන දෙසට ද, 2827 වැනි හා 2826 වැනි කැබැලිවල බටහිර මායිම් ඔස්සේ වයඹ දෙසටද, එතැන් සිට, පාරෙන් එහා 2826 වැනි කැබැල්ලේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ උතුරු දෙසට හා ඊශාන දෙසට ද, මහරගම ගම් ප්ලැනේ 2828 වැනි සහ 2829 වැනි කැබැලිවල උතුරු මායිම් ඔස්සේ ගිණිකොණ දෙසට හා ඊශාන දෙසට ද, මහරගම ගමේ නැගෙනහිර සීමාව දක්වා අඳින ලද රේඛාවකින් මායිම් වී තිබේ;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, මහරගම නැගෙනහිර ගම් සීමාව ඔස්සේ දකුණු දෙසට පන්නිපිටිය ගමේ මායිම හමුවනතැන දක්වා ද, එතැන් සිට, පන්නිපිටියේ උතුරු සීමාව ඔස්සේ පන්නිපිටිය පන්සල පාරේ මධ්‍ය රේඛාව දක්වා ඊශාන දෙසට හා නැගෙනහිර දෙසට ද, එතැන්සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ කෑලණි වැලි දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ඊශාන දෙසට හා ගිණිකොණ දෙසට ද, එතැන්සිට, දිගටම වැටී ඇති එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ පරණ පාරේ මධ්‍ය රේඛාව දක්වා දකුණු දෙසට ද, එතැන්සිට පරණ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ඛකොළඹ—හෝමාගම හයිලෙවල් පාරට වැටෙන හරස්පාරේ මධ්‍ය රේඛාව දක්වා නැගෙනහිර දෙසට ද, එතැන්සිට, එකී හරස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ හයිලෙවල් පාර දක්වා දකුණු දෙසට ද, එතැන් සිට ඒ හරස් පාරේත් ඇරව්වල-පන්නිපිටිය පාරේත් සන්ධි ස්ථානයේ මැද දක්වා නැගෙනහිර දෙසට ද එතැන්සිට ඇරව්වල-පන්නිපිටිය පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ මාම්පේ-කැස්බැව ගම්කාර්ය සහා ප්‍රදේශයේ උතුරු සීමාව දක්වා ගිණිකොණ දෙසට ද අඳින ලද රේඛාවකින් මායිම් වී ඇත්තේය;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, මාම්පේ-කැස්බැව ගම්කාර්ය සහා ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ, 1391 දරන මූලික ප්ලැනේ එච්. 340 වැනි කැබැල්ලේ ගිණිකොණ මේරවර දක්වා බටහිර දෙසටද, එතැන්සිට එකී කැබැල්ලේ නැගෙනහිර මායිම ඔස්සේ පන්නිපිටිය ගම් සැලැස්මේ 3239 වැනි කැබැල්ලේ දකුණු මායිම දක්වා වයඹ දෙසට ද, එතැන්සිට 3239, 3238 වැනි කැබැලිවල දකුණු මායිම් ඔස්සේ බටහිර දෙසට සහ 3251, 3250, 3249, 3248 වැනි කැබැලිවල නැගෙනහිර මායිම් ඔස්සේ දකුණු දෙට ද, 3247, 3246, 3244 වැනි කැබැලිවල දකුණු මායිම් ඔස්සේ ගමිසහා පාර හරහා නිරිත දෙසට ද, 3241, 3240, 3226 වැනි සහ 3227 වැනි කැබැලිවල දකුණු මායිම් ඔස්සේ පන්නිපිටිය ගමේ බටහිර සීමාව දක්වා නිරිත දෙසට හා ඊශාන දෙසට ද, එතැන් සිට, ගොඩිගමුව-ඇරව්වල පාර හරහා ගොඩිගමුවේ නැගෙනහිර ගම් සීමාව ඔස්සේ ගොඩිගමුව-ඇරව්වල පාරේ ඊශාන දෙසට දම්වැල් 4 ක ස්ථානයේ දක්වා, නිරිත දෙසටද, වයඹ දෙසට ද නැවතත් නිරිත දෙසට ද එතැන්සිට, එකී පාරට සහ ගොඩි ගමුව-නල්ලවත්ත ගම සහා පාරට දම්වැල් 4ක් දුරින් සහ සරල සමාන්තරව වයඹ දෙසට සහ බටහිර දෙසට ද, එතැන් සිට නීලම්මහර-බොරැලැස්ගමු පාර හරහා වැටී ඇති ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති බොරැලැස්ගමුව-මහරගම පාරට දම්වැල් 8ක් දුරින් හා ඊට සරල සමාන්තරව, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති මහරගම-බොරැලැස්ගමුව පාරේ සහ වත්තෙගෙදර පාරේ සන්ධි ස්ථානයේ මැද සිට දකුණු දෙසට දම්වැල් 8ක ස්ථානය දක්වා වයඹ හා බටහිර දෙසට ද, එතැන් සිට, වත්තෙගෙදර පාරේ මධ්‍ය රේඛාව සමග සමාන්තරව එකී මධ්‍ය රේඛාව ඔස්සේ බොරලැස්ගමුව වැව කණ්ඩියේ උතුරු කෙළවර දක්වා උතුරු දෙසට ද, එතැන්සිට, වෙල්යායේ අද්දර ඔස්සේ නාවින්න දකුණු ගම්සීමාව හමුවනතුරු බටහිර දෙසට ද, වයඹ දෙසට ද, උතුරු දෙසට ද, එතැන්සිට, එකී ගම් සීමාව ඔස්සේ කොළඹ-පන්නිපිටිය හයිලෙවල් පාරේ මධ්‍ය රේඛාව දක්වා ඊසාන දෙසට ද, එතැන්සිට, එකී පාරේ එකී මධ්‍ය රේඛාව ඔස්සේ වෙල්යාය (වගුරු බිම්) සමග සමාන්තර ස්ථානයක් දක්වා බටහිර දෙසට ද, එතැන්සිට, වෙලේ (වගුරු බිමේ) නැගෙනහිර සහ බටහිර අද්දරවල් ඔස්සේ එකී පාරේ එකී මධ්‍ය රේඛාව දක්වා දකුණු දෙසට සහ වයඹ දෙසට ද, එතැන් සිට, එකී පාරේ එකී මධ්‍ය රේඛාව ඔස්සේ වෙල හරහා ද, එතැන් සිට, වෙලේ (වගුරු බිමේ) අද්දර ඔස්සේ නාවින්නේ බටහිර සීමාව දක්වා දකුණු දෙසට ද, බටහිර දෙසට ද, උතුරු දෙසට ද, නැවතත් බටහිර දෙසට ද, එතැන්සිට බොරලැස්ගමුවේ උතුරු ගම් සීමාව ඔස්සේ දිවුල් පිටිය නැගෙනහිර ගම් සීමාව දක්වා දකුණු දෙසට ද, බටහිර දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් මායිම් වී ඇත්තේ ය.

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට දිවුල්පිටිය නැගෙනහිර ගම් සීමාව ඔස්සේ උතුරු දෙසට ද, දිවුල්පිටිය උතුරු ගම් සීමාව ඔස්සේ පැපිලියාන-ගංගොඩවිල ගම් සීමාව දක්වා බටහිර දෙසට ද, එතැන් සිට, එකී ගම් සීමාව ඔස්සේ දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සහා සීමා දක්වා වයඹ දෙසට ද, එතැන් සිට, මෙම ප්‍රදේශයේ උතුරු මායිම පටන් ගන්නා ස්ථානය දක්වා වයඹ දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් මායිම් වී ඇත්තේ ය.

දෙවැනි උප ලේඛනය

මහරගම සුළු නගරයේ කොට්ඨාශ

අංක 1 දරණ කොට්ඨාශය

ජම්බුගස්මුල්ල

උතුරට: මෙම සුළු නගර සහා ප්‍රදේශයේ උතුරු සීමාවේ බටහිර කෙළවරින් පටන්ගෙන එකී උතුරු සීමාව ඔස්සේ රත්තනපිටිය-දෙල්කඳ පාරේ මධ්‍ය රේඛාව දක්වා ගිණිකොණ දෙසට අඳිනලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට රත්තනපිටිය-දෙල්කඳ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ගංගොඩවිල ගමේ දකුණු සීමාව දක්වා නිරිත දෙසට අඳින ලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට ගංගොඩවිල ගමේ දකුණු සීමාව ඔස්සේ දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සහා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව දක්වා වයඹ දෙසට අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සහා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ මෙම සුළු නගර සහා ප්‍රදේශයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා වයඹ දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් ද මායිම් වී ඇත්තේ ය.

අංක 2 දරණ කොට්ඨාශය

ගංගොඩවිල

උතුරට: රත්තනපිටිය-දෙල්කඳ පාරේ මධ්‍ය රේඛාවට කෝට්ටේ පළාත් ආණ්ඩු සහා ප්‍රදේශයේ දකුණු සීමාව හමුවන ස්ථානයේ සිට, මෙම සුළු නගර සහා ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ මහරගමේ බටහිර සීමාව දක්වා ගිණිකොණ දෙසට ද, ඊසාන දෙසට ද, නැවතත් ගිණිකොණ දෙසට ද, ඊසාන දෙසට ද, ගිණිකොණ දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මහරගම සහ නාවින්නේ බටහිර ගම් සීමා ඔස්සේ මෙම සුළු නගර සහා ප්‍රදේශයේ දකුණු සීමාව දක්වා නිරිත දෙසට ද, දකුණු දෙසට ද, අඳින ලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන්ට යෙදුන ස්ථානයේ සිට මෙම සුළු නගර සහා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ අංක 1 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ දකුණු කෙළවර දක්වා වයඹ දෙසට ද, නිරිත දෙසට ද, නැවතත් වයඹ දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට අංක 1 දරණ කොට්ඨාසයේ නැගෙනහිර මායිම් ඔස්සේ මෙම කොට්ඨාසයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා ඊශාන දෙසට අඳින ලද රේඛාවකින් ද මායිම් වී ඇත්තේ ය.

අංක 3 දරණ කොට්ඨාශය

බටහිර මහරගම

උතුරට: කෝට්ටේ-මිරිහාන පාරේ මධ්‍ය රේඛාවට මහරගමේ බටහිර ගම් සීමාව හමුවන ස්ථානයේ සිට ද, එතැන් සිට, මෙම සුළු නගර සභා ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ, නාගහ කණත්ත පාරේ මධ්‍ය රේඛාවට මහරගම වෙල්යාය නමින් හැඳින් මෙන කුඹුරු යායේ බටහිර තීරය හමුවන ස්ථානය දක්වා ඊසාන දෙසට සහ නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට කැළණිවැලි දුම්රිය මාර්ගය හරහා වැටෙන නාගහකණත්ත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ හසිලෙවල් පාරේ මධ්‍ය රේඛාව දක්වා නිරිත දෙසට ද, එතැන් සිට, හසිලෙවල් පාර ඔස්සේ වත්තෙගෙදර පාරේ මධ්‍ය රේඛාව දක්වා වයඹ දෙසට ද, එතැන් සිට, මහරගම-නාවින්න ගම් සීමාව හරහා වැටෙන වත්තෙගෙදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බොරලැස්ගමුව වැව් කණ්ඩියේ උතුරු කෙළවර දක්වා නිරිත දෙසට අඳිනලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ අංක 2 දරණ කොට්ඨාසයේ දකුණු සීමාවේ දකුණු කෙළවර දක්වා බටහිර දෙසට ද, උතුරු දෙසට ද, ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම කොට්ඨාශයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා අඳින ලද රේඛාවකින් ද, මායිම් වී ඇත්තේ ය.

අංක 4 දරණ කොට්ඨාශය

නැගෙනහිර මහරගම

උතුරට: මෙම සුළු නගර සභා ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ එම උතුරු සීමාවේ නැගෙනහිර කෙළවර දක්වා දකුණු දෙසට ද, නිරිත දෙසට ද, නැගෙනහිර දෙසටද, ඊශාන දෙසට ද, ඊශාන කෝණ දෙසට ද, උතුරු දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ පන්නිපිටියේ උතුරු ගම් සීමාව දක්වා දකුණු දෙසට අඳිනලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට පන්නිපිටියේ බටහිර ගම් සීමාව සහ කැළණිවැලි දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නාගහකණත්ත පාරේ මධ්‍ය රේඛාව දක්වා නිරිත දෙසට සහ වයඹ දෙසට අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම කොට්ඨාසයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා ඊශාන දෙසට අඳින ලද රේඛාවකින් ද, මායිම් වී ඇත්තේ ය.

අංක 5 දරණ කොට්ඨාශය

කඩවිදිය

උතුරට: කැළණිවැලි දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාවත් නාගහ කණත්ත පාරේ මධ්‍ය රේඛාවත් හමුවන ස්ථානයේ සිට එකී දුම්රිය පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ පන්නිපිටියේ උතුරුගම් සීමාවත් එකී දුම්රිය මාර්ගයත් හමුවන ස්ථානය දක්වා ගිනි කොණ දෙසට අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ පන්නිපිටියේ උතුරු ගම් සීමාව දක්වා දකුණු දෙසට අඳිනලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ මාම්පෙ-කැස්බෑව ගම් කාර්ය සහ ප්‍රදේශයේ උතුරු සීමාව දක්වා ගිණිකොණ දෙසට ද, එතැන් සිට, මෙම සුළු නගර සභා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ ගොඩිගමුව-ඇරැව්වල පාරේ මධ්‍ය රේඛාවේ දම්වැල් 4කට නිරිත දෙසින් වූ ස්ථානයක් දක්වා නිරිත දෙසට සහ දකුණු දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, මෙම කොට්ඨාසයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා උතුරු දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් ද, මායිම් වී ඇත්තේ ය.

අංක 6 දරණ කොට්ඨාශය

කොරලැස්ගමුව

උතුරට: අංක 5 දරණ කොට්ඨාශයේ දකුණු සීමාවේ වයඹ කෙළවරේ සිට, අංක 5 දරණ කොට්ඨාශයේ එකී දකුණු සීමාව ඔස්සේ එහි ගිණිකොණ කෙළවර දක්වා ගිණිකොණ දෙසට අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, පන්නිපිටියේ බටහිර ගම් සීමාව ඔස්සේ මාම්පේ-කැස්බෑව ගම් කාර්ය සහ ප්‍රදේශයේ උතුරු සීමාව දක්වා ගිණිකොණ දෙසට ද, එතැන් සිට, මෙම සුළු නගර සභා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ ගොඩිගමුව-ඇරැව්වල පාරේ මධ්‍ය රේඛාවේ දම්වැල් 4කට නිරිත දෙසින් වූ ස්ථානයක් දක්වා නිරිත දෙසට සහ දකුණු දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට අංක 3 දරණ කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ දකුණු කෙළවර දක්වා වයඹ දෙසට ද, බටහිර දෙසට ද, නැවතත් වයඹ දෙසට ද උතුරු දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, මෙම කොට්ඨාසයේ උතුරු සීමාව පටන් ගන්නා ස්ථානය දක්වා උතුරු දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් ද, මායිම් වී ඇත්තේ ය.

අංක 7 දරණ කොට්ඨාශය

පන්නිපිටිය

උතුරට: කැළණිවැලි දුම්රිය මාර්ගයට පන්නිපිටියේ බටහිර සීමාව හමුවන තැන සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව දක්වා ඊශාන දෙසට ද, එතැන් සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ, සුසාන භූමිය පාරේ මධ්‍ය රේඛාවට පරණ පාරේ මධ්‍ය රේඛාව හමුවන ස්ථානය දක්වා නැගෙනහිර දෙසට ද, ඊශාන දෙසට ද සහ ගිණිකොණ දෙසට ද සහ නැගෙනහිර දෙසට ද අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට, අඳින ලද රේඛාවකින් ද;

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට මෙම සුළු නගර සභා ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ මාම්පෙ-කැස්බෑව ගම් කාර්ය සහ ප්‍රදේශයේ උතුරු සීමාව දක්වා බටහිර දෙසට ද ඇඳි රේඛාවකින් ද;

බස්නාහිරට: අවසාන වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට පන්නිපිටියේ බටහිර සීමාව ඔස්සේ මෙම ප්‍රදේශයේ උතුරු සීමාව පටන්ගන්නා ස්ථානය දක්වා වයඹ දෙසට ද, උතුරු දෙසට සහ ඊශාන දෙසට ද අඳින ලද රේඛාවකින් ද මායිම් වී ඇත්තේ ය.

ඇල්. ඒ. ඩී.—ජී.සී. 14/11.

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපණත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව) ආඥාපණතේ 3 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්ප්‍රදේශයේ ගම්කාරයන් සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව වූ 1953ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 2, 3, 4, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 17, 18, 19, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35, 36 සහ 37 කණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට පිලැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාරයන් සභාව විසින් 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ආර්. බී. ඒකනායක,
පිලැස්ස ගම්කාරයන් සභාවේ ප්‍රධානතුමා.

වූ 1957ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින,
පිලැස්ස ගම්කාරයන් සභා කාර්යාලයේදීය.

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආඥාදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආඥාදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ තලාපිට ගම්පත්තුවේ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යය සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකරනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නීත්‍යෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආඥාදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 16, 18, 19, 23, 25, 26, 27, 30, 32, 33, 34, 35, 36 සහ 37 කණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට සම්මත කර ගැනීමට තලාපිට ගම්පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යය සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආඥාදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ජ. බී. බී. ප්‍රංචිමහත්මයා,
තලාපිට ගම්පත්තුවේ ගම්කාර්‍යය සභාවේ සභාපතිතුමා.

1957 ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දින,
තලාපිට ගම්පත්තුවේ ගම්කාර්‍යය සභා කාර්‍යාලයේදීය,
බෙලිහුල්ඔය.

අතුරු ව්‍යවස්ථා

ඇල්.ජ.ඩි—ජසි. 14/12

ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිවේජදයේ) 49 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍යයසභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර 24 වෙනි දින අංක 9,773 දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. සී. ආර්. ගුණවර්ධන,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1957 ඔක්තෝබර් මස 30 දින,
කොළඹ.

අතුරු ව්‍යවස්ථාව

අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත

1. 1 පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) ඡාඩි හෝ කරවල ගබඩා කිරීම;
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම;
(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘතිම පොහොර සැදීම;
(4) විනාකිරි සැදීම;
(5) සබන් සැදීම;
(6) හම් පදම් කරන ස්ථානයක් තබාගැනීම;
(7) ඩුවක් වියලා සකස් කිරීම;
(8) සතුන්ගේ ලේ හෝ මළකුණු උණුකිරීම;
(9) සතුන්ගේ හම් ගබඩා කිරීම;
(10) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම;
(11) මාලු අයිස් දැමීම;
(12) ලෑලි හෝ දැවදඬු පොඟවා සකස් කිරීම;
(13) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම්ගැස්සීම් හා සැදීම;
(14) කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සැදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩාකිරීම;
(15) කෝඩා සැදීම;
(16) දුම්කොළ වියලා සකස් කිරීම;
(17) සුරුට්ටු හෝ සිගරට් සැදීම;
(18) පැණිහකුරු සැදීම;
(19) රා එකතුකිරීමේ ස්ථානයක් තබාගැනීම;
(20) බීඩි සැදීම;
(21) පොල්ලෙලි පෙඟවීම පිණිස පොල්ලෙලි කොටුවක් තබාගැනීම.

2. පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායක වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කබුක්ගල් හෝ කොරලු ලබාගැනීමට ගල්වළක් හෝ ගල්වළවල් කැපීම;
(2) කොප්පරා ගබඩා කිරීම;
(3) පිදුරු ගබඩා කිරීම;
(4) කපොසු පොල් සකස්කිරීම;
(5) මිරන් වියලා සකස්කිරීම හෝ ගබඩා කිරීම;
(6) වළක් කැණීමෙන් හුණුගල් ලබා ගැනීම;
(7) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිදීම;
(8) සෙක්කුවකින් පොල්තෙල් සිදීම;
(9) පැඟිරිතෙල් සිදීම;
(10) කුරුඳුතෙල් සිදීම;
(11) කෙදිවඟී නෙලීම හෝ ගබඩා කිරීම;
(12) කපු පුටුන්, නූල් ආදිය ගබඩා කිරීම;
(13) ලී මඩුවක් තබාගැනීම;
(14) ඉම්පෙල් ගබඩාවක් තබාගැනීම;
(15) ඔවර්ණහරණ සැදීම;
(16) කම්මලක් තබාගැනීම;
(17) මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම;
(18) තේ කර්මාන්තශාලාවක් තබා ගැනීම;
(19) අම්ලකරවංශුව පාවිච්චි කරන කම්මලක් තබාගැනීම;
(20) හාල් මෝලක් තබාගැනීම;
(21) සේඛ රූමනඩ ආදි සිසිල්කිරීම් සැදීම;
(22) කොප්පරා සැදීම.

3. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූද අන්තරාදායක වූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙදි සායම් කිරීම;
(2) ගඩොල් හෝ උලු පිළිවීම;
(3) බැටරි චාජ් කිරීම;
(4) හුනුගල් පිළිවීම, ගබඩා කිරීම, සකස්කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම.

විවිධ දැන්වීම්

කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව

මැයි 1958 පිළිබඳ මැතිවරණ ඔදු, 1939 අංකයේ අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනත

1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 173 වෙනි ඡේදය අනුව කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව මගින් 1958 වර්ෂය සඳහා මෙම පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පිහිටි සෑම නිශ්චල දේපල සඳහා එම දේපල වල වාර්ෂික වටිනා කමෙන් සියයට දෙලක්ෂ බැගින් වැරිපනම් බදු පනවා ඇති බවද, එම වැරිපනම්, සතරෙන් එක් කොටස බැගින් 1958 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවල ගෙවිය හැකි බවද එම වැරිපනම් ඉහත වර්ෂයේ මෙන්ම සියයට දෙලක්ෂ ලෙසම පවත්වන බවද මින් දැනුම් දෙනු ලැබේ.

ඩී. අමරසිංහ,
සභාපති, කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කොළොන්නාව, 5.11.57.

අතුරුගිරිය ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1958 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම් සඳහා අවසර පත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වෙනි පරිවේජදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන අතුරුගිරිය ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඬවන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුඬ වන්නේ කුමන කරුණු නිසාද යන මහ සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහතුන්වැනි දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

අම්බලන්ගොඩ නගර සභාව

1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපණතේ 173 (3) වැනි වගන්තිය යටතේ නගර සභාව සීමාව තුළ පිහිටි නිශ්චල දේපලවල වාර්ෂික තක්සේරුවෙන් 1958 වර්ෂයට සියයට එකොලහක් පසුකිය වර්ෂයෙහි මෙන්ම අයකිරීම් පනවා තිබෙන බවද පිළිවෙළින් ජූනි 30 සහ දෙසැම්බර් 31 දිනවල වාර දෙකකින් ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

සැම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
අම්බලන්ගොඩ, 1957.11.8.

අම්බලන්ගොඩ නගර සභාව

1958 සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු; සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත 334 පරිච්ඡේදය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණතේ 334 පරිච්ඡේදය 4 වන කොටසේ ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභාව සීමාව තුළ තබා ගන්නා හැම බල්ලෙකුට හා බැල්ලියකට 1957 වර්ෂයේ අයකරන ලද ගාස්තුව වන රුපියල් එකහි ශත පණහ 1958 වර්ෂයටද අය කිරීමට පනවා ඇති බවද එකී ගාස්තු 1959 අප්‍රේල් මස 1 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සැම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
අම්බලන්ගොඩ, 1957.11.8.

අම්බලන්ගොඩ නගර සභාව

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. 1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපණතේ 175 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනයෙහි නම් කරන ලද රථ වාහන සහ සතුන්ට ඒ ලේඛනයෙහි සඳහන් කර තිබෙන ගාස්තු පසුකිය වර්ෂයට මෙන්ම 1958 වර්ෂයටද අයකරන බවද :—

2. යළොක්ත ආඥාපණතේ 176 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1957 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද අම්බලන්ගොඩ නගර සභාව දැනුම් දෙනු ලැබේ.

උප ලේඛනය

	රු.	ශ.
මෝටර් කාර්, ට්‍රැක්සිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කුරත්ත, අත්කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයකට ...	5	00
ඕනෑම බයිසිකලයකට, හෝ රෝද තුනේ බයිසිකලයකට—		
(ඒ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නෙහි නම් ...	3	00
(බී) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තකට පාවිච්චි කරන්නෙහි නම්	1	00
(සී) ඕනෑම අන්දමක ගෙන් දෙන්නා බඳින බරකරත්තයකට හෝ තිරික්කලයකට ...	4	00
(ඩී) ඕනෑම අන්දමක තෑලී ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට	2	50
(ඊ) ඕනෑම අන් කරත්තයකට	2	00
(ඇෆ්) ජින් රිකෂෝ රථයකට	2	50
(ජී) ඕනෑම අශ්වයෙකුට, අශ්ව පෝනියෙකුට හෝ බූරුවෙකුට	2	50

සැම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
අම්බලන්ගොඩ, 1957.11.8.

කිණිගොඩ කෝරළේ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1958 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම් සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපණතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කිණිගොඩ කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්සභාව සහ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන්න සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම් ගැසට් පත්‍රයේ පළවූ දින සිට 28 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

උප ලේඛනය

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය	ස්ථානය සහ වෙළඳාම
(1) ශ්‍රී. ඇම්. හනීපා, රඹුක්කන ...	ජා හොනියා කොටුව, හේවාදිවෙල හරක් මස් කඩයක්.

පී. ආර්. රත්නායක,
කිණිගොඩ කෝරළේ ගම්සභාවේ සභාපතිතැන.

වම් 1957ක්වූ නොවැම්බර් මස 1 වෙනි දින,
කිණිගොඩ කෝරළේ ගම්සභාව සහ කාර්යාලයේදීය,
නවගමුව, රඹුක්කන.

රම්බොඩගල්ල ගම්ප්‍රදේශයේ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත විස්තර දක්වන උප ලේඛනයෙහි සඳහන් අය ඔවුන් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1958 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන රම්බොඩගල්ල ගම්සභාව සහ ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසාය කියි දක්වන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින දහයතරක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණතේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධනය වූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උප ලේඛනය

ඉල්ලුම්කරුගේ නම	පිහිටි ස්ථානය
(1) කේ. අබ්දුල් හමීදු	... මන්දන්ඩාවල, පානගමුව
(2) ඇම්. ඇම්. තාහිර්	... වැලිකුඹුර, පානගමුව
(3) පී. ෂකුස්	... පල්ලෙමුල්ල, පානගමුව

ඩබ්ලිව්. ටී. වී. ඇස්. ද අල්විස්,
රම්බොඩගල්ල ගම්ප්‍රදේශයේ පාලක නිලධාරිතැන.

ගම්සභා කාර්යාලය,
දෙල්වීට, 6.11.1957.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරනලදී